# කො/ විශාඛා විද්‍යාලයීය

# පාසල් සංවර්ධන සමිතිය

# 45 වන සංවත්සරය

Visakha Vidyalaya

පඤ්ඤාය පරිසුජ්ඣති | BY WISDOM IS ONE CLEANSED

**2024** මාර්තු මස **28** වන බ්‍රහස්පතින්දා දින ප.ව. **1.30** ට පෙරමියෙස් දියෙස් ශාලාවේදී පැවැත්වේ.

## විශාඛා විද්‍යාලයීය පාසල් සංවර්ධන සමිතියේ

## 45 වන වාර්ෂික මහා සභා රැස්වීම.

**න්‍යාය පත්‍රය**

- පන්සිල් ගැනීම
- අපගෙන් සමුගත් විදුහල්පතිවරියන්, නියෝජ්‍ය විදුහල්පතිවරියන්, ගුරුභවතුන්, ශිෂ්‍යාවන් සහ දෙමාපියන් සිහිකරනු වස් විනාඩි 02 ක නිශ්ශබ්දතාව.
- නොපැමිණෙන බව දැන්වූ සාමාජික සාමාජිකාවන්ගේ නාම ලේඛනය ඉදිරිපත් කිරීම.
- ගරු සභාපතිතුමියගේ කථාව.
- ගරු ලේකම්තුමිය විසින් 2023 වසර මහා සභා රැස්වීමේ වාර්තාව ඉදිරිපත් කිරීම සහ එය සභා සම්මත කර ගැනීම.
- 2024 අයවැය වාර්තාව ගරු භාණ්ඩාගාරිකතුමිය විසින් ඉදිරිපත් කිරීම සහ එය සභා සම්මත කර ගැනීම.
- නව නිලධාරී මණ්ඩලය පත් කිරීම 2024/2025
- යෝජනා ඉදිරිපත් කිරීම.
- ගරු ලේකම්තුමියගේ ස්තූති කථාව.

## විශාඛා විද්‍යාලයීය පාසල් සංවර්ධන සමිතියේ 45 වන වාර්ෂික වාර්තාව

2023 මාර්තු මස 30 වන දින ප.ව. 1.45 ට විද්‍යාලයීය ජෙරමියෙස් දියෙස් ශාලාවේ දී පැවැත්වූ 44 වන මහා සභා රැස්වීමේදී පහත සඳහන් නිලධාරී මඩුල්ල ප්‍රමුඛ පාසල් සංවර්ධන කමිටුව තෝරා පත් කර ගන්නා ලදී.

**අනුශාසකවරු**

**පැවිදි**

අමරපුර ශ්‍රී ධර්මරක්ඛිත මහා නිකායේ මහානායක ධූරීන ත්‍රිකුණාමලයේ ආනන්ද මහනායක හිමිපාණෝ

වජිරාරාමවාසි පූජ්‍ය පණ්ඩිත කඹුරුගමුවේ මහානාහ හිමිපාණෝ

**ගිහි**

තිස්ස කුරේ මහතා
රජීව් ඩයස් මහතා

**පාසල් සංවර්ධන කමිටුව**

**ගරු සභාපතිනිය**
විදුහල්පති එච්.එම්.සී.එම්.කේ සෙනවිරත්න මිය

**ගරු ප්‍රධාන ලේකම්**

රසාංගනි ප්‍රේමතිලක මිය

**ගරු භාණ්ඩාගාරික**

නිසංසලා මුණසිංහ මිය

**ගරු උපලේකම්**

තිවංකා සෙනෙවිරත්න මිය

**නියෝජ්‍ය විදුහල්පතිනියන්**

දුලානි ප්‍රියදර්ශනී මිය
ජීවනා ආරියරත්න මෙය

**සහකාර විදුහල්පති**

චන්ද්‍රිකා රත්නායක මිය
නිශාන්තිකා වෙල්ලප්පුලි මිය
චමරි ගුණසේකර මිය

**අංශ ප්‍රධාන ගුරු මහත්මීන්**

ඩබ්.ජී.එස්.මල්කාන්ති මිය
මනෝජා ප්‍රනාන්දු මිය
බුද්ධිනි මැදවත්ත මිය
ඩබ්.ලයනල් මයා
විරාමි ද සිල්වා මිය

**දෙමාපිය නියෝජිත**

අරුණ සමරසිංහ මයා
කේ.පී.නිමල් ධර්මසිරි මයා
කේ.කමන්ත ප්‍රනාන්දු මයා
නිල්මිණි මාන්නප්පෙරුම මිය
චමින්ද එදිරිසිංහ මයා
අවන්ති සෙනෙවිරත්න මිය
කීර්ති ඇල්විටිගල මයා

**ආරාධිත සාමාජික සමාජිකාවන්**

රවීන්ද්‍ර ඩයස් මයා
මංජුල රණසිංහ මයා
අචින්තා ජයවර්ධන මිය

**සුබ පතන්නන්**

සීතා සිරිවර්ධන මිය
මහින්ද මඩිහහේවා මයා

**ආදි ශිෂ්‍ය සංගමය**

නිශාන්ති විමලරත්න මිය
පුන්සිරිනි මාලවි මිය

**කලාප නියෝජිත**

පුබුදු එන්.හේවගේ මිය

# මූල්‍ය කටයුතු - 2023/2024

පසුගිය වසරවල මෙන්ම පාසල් සංවර්ධන සමිති ක්‍රියාදාමයට අනුකූලව පාසලේ ආරක්ෂක කටයුතු, සනීපාරක්ෂක කටයුතු, ගිලන් කාමර පාලිකා, කම්කරු පාලිකා, සුළු සේවකයින්ගේ වැටුප් අප සමිතිය මගින් ගෙවනු ලැබේ. තව ද ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට අදාළව ක්‍රීඩා පුහුණුකරුවන්ගේ ගෙවීම් ද, පෙරදිග තූර්ය වාදක කණ්ඩායම් පුහුණු කිරීමේ ගෙවීම් ද , කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ඇතිව අප සමිතිය විසින් දරනු ලැබේ.

2023 වර්ෂය තුළදී පළමු ශ්‍රේණිය දියණියන් පිළිගැනීමේ "සිඟිති පියවිලි" උත්සවය, සිතු මූර්ති චිත්‍ර ප්‍රදර්ශනය, වාර්ෂික ක්‍රීඩා උත්සවය, වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය, සිඟිති රැඟුම් ප්‍රසංගය, මියැසි විශාඛා ප්‍රසංගය, බටහිර තූර්ය වාදන ප්‍රසංගය වැනි උත්සව අවස්ථාවන් අති සාර්ථක ලෙස පැවැත්වීමට සහය ලබාදෙන ලදි.

2022 වර්ෂයේ අ.පො.ස (සා.පෙළ) දරුවන්ට හා 2023 අ.පො.ස (උ.පෙළ) දරුවන්ට සාර්ථක වැඩමුළු පැවැත්වීම, අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල සංවර්ධන ව්‍යාපෘතිය සිදුකිරීම, නේවාසිකාගාරයේ සිටින 6 සිට 11 ශ්‍රේණිය දක්වා වන දරුවන් සඳහා උදෑසන 6.30 සිට 7.30 දක්වා අමතර ඉගැන්වීම් කටයුතු ආරම්භ කිරීමට පාසල් සංවර්ධන සමිතියේ දායකත්වයෙන් සිදු කරන ලදි.

දරුවන්ගේ දිනපතා පැමිණීම ප්‍රදර්ශනය කිරීම සඳහා ඩිජිටල් පුවරුවක් සවිකිරීම, පිහිනුම් තටාක පරිශ්‍රයේ වියන් (Canopy) සහ උසස් පෙළ කලා අංශයේ වියන් (Canopy) අලුත්වැඩියා කිරීම, උසස් පෙළ විද්‍යාගාරය අලුත්වැඩියා කර පිළිසකර කිරීම, 6/7 ශ්‍රේණියේ ගොඩනැගිල්ලේ ප්‍රධාන විදුලි රැහැන් පද්ධතිය අලුත්වැඩියා කර පිළිසකර කිරීම, ප්‍රාථමික ගොඩනැගිල්ලේ ප්‍රධාන විදුලි පුවරුව අලුත්වැඩියා කිරීම, පිහිනුම් තටාකයේ වහලය සම්පූර්ණයෙන් අලුත්වැඩියා කර එහි යකඩ බාල්ක පිරිසිදු කර මුහුදු සුළඟට ඔරොත්තු දෙන ලෙස තීන්ත ආලේප කිරීම සහ ක්‍රීඩා පිටියේ කොටසක තීන්ත ආලේප කිරීම වැනි භෞතික සංවර්ධන කටයුතු රැසකට සහය ලබාදෙන ලදි.

ඉලක්කයට වෙඩි තැබීමේ වෙඩි පිටියක් සකස් කිරීම, ක්‍රීඩා අංශයේ ලැප්ටොප් අලුත්වැඩියාකර ක්‍රීඩාගාරයට ජල පෙරනයක් ලබා ගැනීම, නෙට්බෝල් ක්‍රීඩාව සඳහා ගෝල් කණු සකස් කිරීම වැනි ක්‍රීඩා අංශයේ කටයුතු සඳහාද සහය ලබාදීමට හැකිවිය.

2023 වර්ෂයේදී පැවති සියලුම විෂය සමගාමී ව්‍යාපෘති ඉතා සාර්ථකව නිම කිරීමට සහයෝගය දුන් දෙමාපියන්ටද, ආදි ශිෂ්‍යා සංගමයටද, විවිධ ආයතන හා නිලධාරී පිරිසටද අපගේ ස්තූතිය පිරිනමමු.

## විෂය සමගාමී ජයග්‍රහණ -2023.

- ශ්‍රී ලංකා තාරකා විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියේදී රන් පදක්කම් 01, රිදී පදක්කම් 02 සහ ලෝකඩ පදක්කම් 01 ක් ලබා ගැනීම.
- ශ්‍රී ලංකා තාරකා විද්‍යා (කනිෂ්ඨ) ඔලිම්පියාඩ් තරගාවලියේදී රිදී පදක්කම් 01 දිනා ගැනීම.
- ආනන්ද විද්‍යාලය මගින් සංවිධානය කළ තූර්ය වාදක තරගාවලියෙන් ජ්‍යෙෂ්ඨ අංශයේ ජනප්‍රියම වාද්‍ය වෘන්දය ලෙස සම්මානයට පත්වීම.
- මහනාම විද්‍යාලය මගින් සංවිධානය කරන ලද අන්තර් පාඨශාලයීය විද්‍යා සංගම් දෙවන ස්ථානය දිනා ගන්නා ලදි.
- කලාප මට්ටමේ නාට්‍ය තරගාවලියේදී කනිෂ්ඨ අංශයේ තුන්වන ස්ථානය දිනා ගන්නා ලදි.
- සමස්ත ලංකා අපරදිග සංගීත හා නැටුම් තරගාවලියේදී මිශ්‍ර සංගීත භාණ්ඩ වාදන ශීර්ෂය යටතේ මිශ්‍ර වාදන (ජ්‍යෙෂ්ඨ - බාලිකා) ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදි.
- සමස්ත ලංකා ගායන තරගාවලියේදී ගායන ශීර්ෂය යටතේ (ජ්‍යෙෂ්ඨ - බාලිකා) A1 කාණ්ඩයේ ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදි.
- පළාත් මට්ටමේ ඉංග්‍රිසි භාෂා දින තරගාවලියේදි

| | | |
|---|---|---|
| 8 ශ්‍රේණිය | අසා ලිවීම | -ප්‍රථම ස්ථානය |
| 13 ශ්‍රේණිය | අසා ලිවීම | -තෙවන ස්ථානය |
| 10 ශ්‍රේණිය | නිර්මාණාත්මක රචනා | -ප්‍රථම ස්ථානය |
| 8 ශ්‍රේණිය | නිර්මාණාත්මක රචනා | -ප්‍රථම ස්ථානය |
| 9 ශ්‍රේණිය | නිර්මාණාත්මක රචනා | -තෙවන ස්ථානය |
| 12 ශ්‍රේණිය | බලා ලිවීම | -ප්‍රථම ස්ථානය දිනාගන්නා ලදි. |

- සමස්ත ලංකා අපරදිග සංගීත හා නැටුම් තරගාවලියේ මිශ්‍ර සංගීත භාණ්ඩ වාදන (ජ්‍යෙස්ඨ - බාලිකා) A1 කාණ්ඩයේ ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදි.
- අන්තර් පාඨශාලයීය ශේක්ස්පියර් නාට්‍ය තරගාවලියේදී දෙවන ස්ථානය දිනාගන්නා ලදි.
- මියුසියස් විද්‍යාලය මගින් සංවිධානය කරන ලද Minerva තරගාවලියේදි ශූරතාවය හා අනු ශූරතාවය දිනා ගන්නා ලදි.
- සමස්ත ලංකා ඉංග්‍රීසි භාෂා තරගාවලියේදී අසා ලිවීම තෙවන ස්ථානය දිනා ගන්නා ලදි.
- සමස්ත ලංකා චිත්‍ර තරගාවලියේදී ප්‍රථම ස්ථාන 4ක් දිනා ගැනිම.

# ප්‍රතිඵල විශ්ලේෂණය

## අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල - 2022

| | |
|---|---|
| විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 363 |
| සමත් ශිෂ්‍ය සංඛ්‍යාව (උසස් පෙළ සඳහා සුදුසකම් ලත්) | 358 |
| විෂයයන් 8කට හෝ ඊට වැඩි A සාමාර්ථ්‍ය ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | 206 |

## අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල - 2022

- **විද්‍යා ගණිත අංශය**

| | |
|---|---|
| විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 306 |
| සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 239 |
| විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට සුදුසකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | 239 |
| ප්‍රතිශතය | 78% |

- **වාණිජ අංශය**

| | |
|---|---|
| විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 126 |
| සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 119 |
| විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | 119 |
| ප්‍රතිශතය | 94% |

- **කලා අංශය**

| | |
|---|---|
| විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 138 |
| සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 125 |
| විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට සුදුසකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | 125 |
| ප්‍රතිශතය | 91% |

## 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2023

| | |
|---|---|
| විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 205 |
| සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 38 |
| ප්‍රතිශතය | 18.54% |
| ලකුණු 100 සීමාව ඉක්මවූ ශිෂ්‍ය සංඛ්‍යාව | 171 |
| ප්‍රතිශතය | 83.42% |

# 2022 අ.පො.ස (උ/පෙළ) විභාගය
## ප්‍රතිඵල විශ්ලේෂණය

### සිංහල මාධ්‍යය

| | විස්තරය | පළමුවර | | | |
|---|---|---|---|---|---|
| | | විද්‍යා | වාණිජ | කලා | පොදු |
| 1 | උසස් පෙළ විභාගයට පෙනී සිටි සංඛ්‍යාව | 261 | 94 | 136 | 02 |
| 2 | උසස් පෙළ විභාගයෙන් සමත් සංඛ්‍යාව (විෂයයන් 3 ක් හෝ ඊට වැඩි) | 206 | 87 | 122 | |
| 3 | විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසකම් ලත් සංඛ්‍යාව | 206 | 87 | 122 | |
| 4 | විෂයයන් 3 ම අසමත් සංඛ්‍යාව | 18 | 02 | 01 | |
| 5 | විෂයයන් 3 ටම A සාමාර්ථ්‍ය ලබා ගත් සංඛ්‍යාව | 42 | 39 | 43 | |

### ඉංග්‍රීසි මාධ්‍යය

| | විස්තරය | පළමුවර | | | |
|---|---|---|---|---|---|
| | | විද්‍යා | වාණිජ | කලා | පොදු |
| 1 | උසස් පෙළ විභාගයට පෙනී සිටි සංඛ්‍යාව | 45 | 32 | 02 | 07 |
| 2 | උසස් පෙළ විභාගයෙන් සමත් සංඛ්‍යාව (විෂයයන් 3 ක් හෝ ඊට වැඩි) | 33 | 32 | 02 | 07 |
| 3 | විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසකම් ලත් සංඛ්‍යාව | 33 | 32 | 02 | 07 |
| 4 | විෂයයන් 3 ම අසමත් සංඛ්‍යාව | 03 | - | | |
| 5 | විෂයයන් 3 ටම A සාමාර්ථ්‍ය ලබා ගත් සංඛ්‍යාව | 06 | 20 | | |

## පාසල් සංවර්ධන සමිතිය

## අධ්‍යාපන අනුකමිටු වාර්තාව - 2023/2024

- 2022 අ.පො.ස සාමාන්‍ය පෙළ (2023 මැයි) සිසුන් සඳහා සියලුම විෂයන්හි සම්මන්ත්‍රණ පවත්වන ලදි.
- 2022 අ.පො.ස සාමාන්‍ය පෙළ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා සහභාගි වූ පරීක්ෂණ මඬුල්ල වෙත දින 10ක් පුරාවට සංග්‍රහ කටයුතු සූදානම් කරන ලදි.
- 2022 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුන් සඳහා ගණිතය විෂයට ලකුණු ඉහළ නැංවීමේ ව්‍යාපෘතියට සහභාගි වූ මොරටුව විශ්ව විද්‍යාලයේ සිසුන්ට සංග්‍රහ සහ ඇගයීම.
- 2022 අ.පො.ස උසස් පෙළ (2024 ජනවාරි) ගණිත අංශයේ සිසුන් සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය අශ්විනි අමරසිංහ මහතා සහ එම විශ්ව විද්‍යාලයේ සිසුන් 15ක් සහභාගි වූ වැඩමුළුවට දායකත්වය ලබාදිම.
- 2022 අ.පො.ස උසස් පෙළ (2024 ජනවාරි) විද්‍යා අංශයේ සිසුන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්විමට දායකත්වය ලබාදීම.
- පාසලේ සියලුම ගුරු භවතුන් වෙනුවෙන් විශේෂ සම්මන්ත්‍රණයක් පැවැත්විමට දායකත්වය ලබාදීම.
- 2022 අ.පො.ස උසස් පෙළ උසස් ප්‍රතිඵල ලබාදිමට කටයුතු කළ ගුරුභවතුන් ඇගයීමට සහ පැසසීමට උත්සවයක් පැවැත්වීම.
- 2022 අ.පො.ස සාමාන්‍ය පෙළ උසස් ප්‍රතිඵල ලබාදිමට කටයුතු කළ ගුරුභවතුන් ඇගයීමට සහ පැසසීමට උත්සවයක් පැවැත්වීම.
- 2025 උසස් පෙළ නවක සිසුන් හට නව විෂයන් හඳුන්වාදීමේ වැඩසටහන සඳහා සංග්‍රහ කටයුතු සූදානම් කරන ලදි.
- 2023 අ.පො.ස සාමාන්‍ය පෙළ (2024 මැයි) සිසුන් සඳහා සියලුම විෂයන්හි සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම.
- අ.පො.ස සාමාන්‍ය පෙළ ප්‍රතිඵල සංවර්ධන ව්‍යාපෘතිය සිදුකරන ලදි.
- නේවාසිකාගාරයේ සිටින 6 සිට 11 වසර දක්වා සිසුන් සඳහා ප්‍රධාන විෂයන්ට ඉගැන්වීමේ වැඩසටහන සඳහා දායකත්වය ලබාදීම.

## <u>පාසල් සංවර්ධන සමිතිය</u>

## <u>භෞතික සම්පත් අනුකම්පිතු වාර්තාව - 2023/2024</u>

- පිහිනුම් තටාකයේ වහළයේ යකඩ තාප්ප සියල්ල සූරා මුහුදු ආශ්‍රිත පරිසර පද්ධතියට ගැළපෙන ලෙස තීන්ත ආලේප කිරීම සහ වහළයේ සෙවිලි තහඩු පරීක්ෂා කර දිරාගිය තහඩු ඉවත්කර, අලුතින් තහඩු එක්කිරීම සහ අනෙක් තහඩු සුදුසු ලෙස අලුත්වැඩියා කටයුතු කිරීම.
- පිහිනුම් තටාකයේ ඇතුළත සහ පිටත බිත්ති තීන්ත ආලේප කිරීම.
- පිහිනුම් තටාකයේ ඇතුළුවීමේ දොරටුව අසල ඇති යකඩ වැට මුහුදු ආරක්ෂණ තීන්ත ආලේප කිරීම.
- ශිෂ්‍ය නේවාසිකාගාරයේ පිටුපස ඇති යකඩ තරප්පු පෙළ තීන්ත ආලේප කර පිළිසකර කිරීම.
- ප්‍රධාන ශාලාව පිටුපස ඇති වතුර ටැංකිය රඳවා ඇති යකඩ රාමුව පිළිසකර කර තීන්ත ආලේප කිරීම.
- ජාතික ගොඩනැගිලි සහ පර්යේෂණ ආයතනය මගින් පාසලේ පැරණි ගොඩනැගිලි පිළිබඳ තක්සේරු වාර්තා ලබාගන්නා ලදි. ඒ අනුව එම ගොඩනැගිලිවල පිළිසකර කටයුතු නිර්දේශ කිරීම.
- පාසලේ පැරණි ගොඩනැගිල්ලක් වන **බෝගන්විලා** ගොඩනැගිල්ලේ වහළය අලුත්වැඩියා කිරීම ආදි ශිෂ්‍ය සංගමය මගින් සිදුකරන අතර එහි විදුලි රැහැන් පද්ධතිය, සිවිලිම, බිත්ති සහ බිම පිළිසකර කිරීමට ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහය ලබාගෙන ඉදිරියේදි කරනු ලබයි.
- අ.පො.ස උ/පෙළ භෞතික හා රසායන විද්‍යා විද්‍යාගාරවල ඇති ජනෙල් සහ දොරවල් පිළිසකර කිරීම. එහි භාවිතා කළ නොහැකි ජලකරාම 12 දෙමාපියන්ගේ අනුග්‍රාහකත්වයෙන් සවිකරන ලදි.
- 12/13 භෞතික හා රසායනාගාරවල පැවති ගෑස් නල පද්ධතියේ පැවති කාන්දුවීම පිළිසකර කිරීම.
- ශිෂ්‍ය පැමිණීමේ සටහන් කිරීමේ පද්ධතියක් ඇති කිරීම සඳහා මූලික කටයුතු කිරීම.
- පාසල් ඇමතුම් ශබ්ද පද්ධතිය (Public Admin System) හා පාසල් Intercom පද්ධතියේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන ලදි.
- උසස් පෙළ කලා අංශයේ අනාරක්ෂිතව පැවති කොන්ක්‍රීට් හිරු ආවරණ කඩා ඉවත් කිරීම සිදුකිරිමත් අලුතින් කැනපි වහළ සවිකිරීමත් සිදු කරන ලදි.

# <u>පාසල් සංවර්ධන සමිතිය</u>

## <u>බෞද්ධ අනුකමිටු වාර්තාව -2023/2024</u>

- 2023.05.06 දිනට යෙදී තිබුණු වෙසක් උත්සවය වෙනුවෙන් විශාඛා බෝ සමිඳු අවට පරිශ්‍රය, පාසල් භූමිය, සහ පාසලේ තාප්පය විදුලි බුබුළු, වෙසක් කූඩු සහ බෞද්ධ කොඩි යොදා සරසා අලංකාර කිරීම.

- විශාඛා බෝ සමිඳුන් අභියස වැඩසිටින ප්‍රධාන බුදු පිළිම වහන්සේගේ වීදුරු කුටි 2 හා වහළ 2ක, බෝ අතු කඩා වැටී වීදුරු බිඳී තිබූ අතර, එම වහළ 2ට වීදුරු යොදා පිළිසකර කිරීම.

- බෞද්ධ අනුකමිටුවේ අනුශාසකතුමිය ලෙස කටයුතු කළ නියෝජ්‍ය විදුහල්පතිනි කළණි සූරියප්පෙරුම මහත්මිය ස්ථාන මාරු වී යාම වෙනුවෙන් බෝධි පූජාවක් සංවිධානය කිරීම සහ සමරු තිළිණයක් ලබාදීම.

- වාර්ෂිකව ශ්‍රී මහා බෝධින් වහන්සේ වෙනුවෙන් සිදුකරනු ලබන පූජාව සඳහා වෙන් කර තිබූ මුදල වැඩිකිරීම.

- බෝ සමිඳුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමට උද්භිද විද්‍යා දෙපාර්තුමේන්තුවේ උපදෙස් ලබා ගැනීම.

- එම උපදෙස් අනුව බෝ සමිඳුන්ගේ දිරාපත්ව තිබූ ශාක කොටස් ඉවත්කර ඇතුළත කුහරය පිරිසිදු කර කැන්ඩසන් ආලේපකර එම කුහරයට රොඩු එකතුවීම වැළැක්වීමට දැලක් යොදා ආවරණය කිරීම.

- බෝධින් වහන්සේ පිටුපස ඇති දැල් රාක්කය මළකඩ ඉවත්කර පිරිසිදු කර ඉබි යතුරු දමා බඩු බාහිරාදිය ආරක්ෂා වන ලෙස සකස් කිරීම.

- 2023.01.16 දිනට යෙදුණු පාසලේ 106 වන උපන් දිනයට සමගාමීව බෝධි පූජාව පැවැත්වීම සහ දහවල් ස්වාමීන් වහන්සේලා දහනමක් විෂයෙහි සංඝගත දක්ෂිණාවක් පිරිනැමීම.

- බෝධින් වහන්සේ අවට පරිශ්‍රයේ නොදැල්වුන විදුලි පහන් පිළිසකර කිරීම.

- මරණයට කැප වූ ගවයින් නිදහස් කිරීම.

- පෙර පෝය, පසු පෝය ධර්ම දේශනා සංවිධානය කිරිම.

- ආදි කර්තෘ දිනය නිමිත්තෙන් 2023.03.25 දින සවස බෝධි පූජාව සහ සර්ව රාත්‍රික පරිත්‍රාණ දේශනය පැවැත්වීම. 2023.03.26 දින ස්වාමීන් වහන්සේලා තිස් නමක් විෂයෙහි සංඝගත දක්ෂිණාව පිරිනැමීම.

- දළදා වහන්සේ වෙනුවෙන් වාර්ෂිකව සිදුකරනු ලබන දළදා පූජාව සංවිධානය කිරීම.

## පාසල් සංවර්ධන සමිතිය

## ආරක්ෂක හා ප්‍රවාහන අනුකමිටු වාර්තාව - 2023/2024

- දැනට ධාවනයෙන් ඉවත් කර ඇති ජංගම පුස්තකාලයක් ලෙස භාවිතා කරන කලම්බු රයිඩර් බස් රථය නැවත ධාවන තත්වයට පත්කර පාසලේ දියණියන්ගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට නිර්දේශය ලබාදීම.

- පාසලේ දැනට ධාවනයේ පවතින වෑන් රථ කෙරෙහි පවතින පින්තාරු වැඩ හැකි ඉක්මනින් කළ යුතු බව කමිටු සාමාජිකයින් දන්වා සිටින ලදි.

- ඉසුසු බස් රථයේ පැවති සියලුම නඩත්තු කටයුතු මේ වන විට අවසන් කර ඇත.

- පාසලේ 3 වන ගේට්ටුව අසල පවතින උදෑසන රථවාහන අවහිරතාවය මේ වන විට යථා තත්වයට පත්කර ඇත.

- පාසලේ ආරක්ෂක අංශයේ ප්‍රයෝජනය සඳහා Safety Corn 10 ක් ලබා දී ඇත.

- පාසලේ දියණියන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ගතහැකි සියලුම ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත.

# <u>පාසල් සංවර්ධන සමිතිය</u>

## <u>පරිසර අනුකමිටු වාර්තාව - 2023/2024</u>

- අනාරක්ෂිත තත්වයේ පැවති ගස්වැල් කපා ඉවත් කිරීමේ ඉංජිනේරු වාර්තා සකසන ලදි.
- අනාරක්ෂිත තත්වයේ පැවති ගස්වල අතු අවස්ථා කිහිපයකදී කපා ඉවත් කරන ලදි.
- 2023.05.13 සහ 15 දිනයන්හිදි පාසල් භූමිය සම්පූර්ණයෙන් ශුද්ධ පවිත්‍ර කර අවසන් කරන ලදි.
- 2023.05.15 දින සහ 19 දින පාසල් භූමිය තුළ එක්රැස්ව පැවති කැළි කසළ ඉවත් කිරීම සිදුකරන ලදි.
- ක්‍රීඩා උලෙළ අතරතුරදී පෞද්ගලික පිරිසිදු කිරීමේ ආයතනයක සේවකයින් යොදවා පිරිසිදු කරන කටයුතු කරන ලදි.
- පාසල් නිවාඩු කාලයෙන් පසු එළඹෙන පාසල් වාරයට ප්‍රථම පාසල පිරිසිදු කිරීමේ කටයුතු සිදුකරන ලදි.
- ඩෙංගු ශ්‍රමදාන කටයුතු අවස්ථා කිහිපයකදි සිදුකරන ලදි.
- පාසල් ක්‍රීඩාංගන පරිශ්‍රය තුළ පවතින කාණු පද්ධතිය සහ පාසලේ අනෙකුත් කාණු පද්ධති සියල්ල අවස්ථා කිහිපයකදී පිරිසිදු කිරීමේ කටයුතු දියත් කෙරිණි.

## පාසල් සංවර්ධන සමිතිය

## ක්‍රීඩා අනුකමිටු වාර්තාව - 2023/2024

- පාසල් සංවර්ධන කමිටු වාර්ෂික මහා සභාවේදී පිහිටවනු ලැබූ ක්‍රීඩා අනුකමිටුව පාසලේ සියලු ක්‍රීඩා සඳහා නියෝජනයක් නොතිබූ බැවින් ගරු විදුහල්පතිතුමියගේ උපදෙස් මත සියලු ක්‍රීඩා නියෝජනය වන පරිදි එක් එක් ක්‍රීඩාවල ක්‍රීඩා භාර ආචාර්යවරියන් මාර්ගයෙන් එම ක්‍රීඩා සඳහා කැපවීමක් සහ එම ක්‍රීඩා නගා සිටුවීමට උනන්දුවක් දක්වන දෙමව්පියන්ගෙන් සැදුම්ලත් කමිටුවක් ස්ථාපිත කිරීම.
- පිහිනුම් තටාකයේ වහළය සම්පූර්ණයෙන් අලුත්වැඩියා කොට එහි යකඩ බාල්ක සම්පූර්ණයෙන් ශුද්ධ කර මුහුදු සුළඟට ඔරොත්තු දෙන තීන්ත ආලේප කිරීම සහ ක්‍රීඩා පිටිය කොටසේ තීන්ත ආලේප කිරිම.
- ක්‍රීඩා පිටියේ රාත්‍රි පුහුණුවීම් සඳහා දැනට ඇති ආලෝක කුලුණු වල ආලෝක පද්ධතිවල ක්‍රියා විරහිත වී ඇති විදුලි බුබුලු අලුත්වැඩියා කිරිම.
- ඉලක්කයට වෙඩි තැබීමේ වෙඩි පිටියක් සකස් කිරිම.
- 2023 වාර්ෂික ක්‍රීඩා උත්සවය මැයි මස 19 වන දින පොලිස් ක්‍රීඩාංගනයේදි ඉතා උත්කර්ෂවත් අන්දමින් සංවිධානය කිරිමට හැකිවිය.
- ක්‍රීඩාගාරයට ජල පෙරනයක් ලබාදීම.
- ක්‍රීඩා අංශයේ ලැප්ටොප් පරිගණකය අලුත්වැඩියා කිරිම.
- පැසිපන්දු ක්‍රීඩා පිටියට ජංගම පැසිපන්දු පුවරුවක් සහ කණුවක් ලබා ගැනීමට කටයුතු කිරිම.
- ටෙනිස් පිටියට ආදි ශිෂ්‍යා සංගමයේ අනුග්‍රහය ඇතිව එහා මෙහා කළ හැකි දැල් රාමුවක් ලබාදීම.
- ක්‍රීඩා භාණ්ඩ සුරක්ෂිතව ගබඩා කිරිම සඳහා පිහිනුම් තටාකය යට පිහිටි ක්‍රීඩා මණ්ඩපය දෙසින් ඇති කොටස භාවිත කිරීමට අනුමැතිය විදුහල්පතිතුමිය විසින් ලබාදී ඇති අතර අලංකාර ගබඩා සංකීර්ණයක සැලසුම් නිර්මාණයක් සහ ඇස්තමේන්තුවක් සකස් කර එම ව්‍යාපෘතිය ආරම්භ කිරිම.
- ක්‍රීඩාගාරය ශුද්ධ පවිත්‍ර කිරීමේ ශ්‍රමදානයක් බැඩ්මින්ටන් හා ක්‍රීඩාගාරය භාවිතා කරන ක්‍රීඩාවලට සම්බන්ධ දෙමව්පියන් විසින් සූදානම් කිරිම.
- විශාඛා විද්‍යාලය හා කාන්තා විද්‍යාලය අතර වාර්ෂික වෝටර් පෝලෝ තරගාවලිය සාර්ථක කර ගැනීමට සහය දැක්වීම.
- සුජාතා විද්‍යාලය හා විශාඛා විද්‍යාලය අතර හිටපු විදුහල්පතිනි මොට්වානි මහත්මිය අනුස්මරණ ශූරතා දැල්පන්දු තරගාවලිය නොවැම්බර් මස 23 දින උත්කර්ෂවත් අයුරින් පැවැත්විමට දායකත්වය සැපයීම.
- නෙට්බෝල් ක්‍රීඩාව සඳහා ගෝල් කණු සකස් කිරිම.
- දෙසැම්බර් මස 15 දින ක්‍රීඩා වර්ණ රාත්‍රිය පැවැත්වීමට කටයුතු සංවිධානය කරගෙන යාම.
- වර්ණ රාත්‍රියේ තෝරාගැනීමේ නිර්ණායක යාවත්කාලීන කිරිමට කටයුතු කිරිම.
- සියලුම ක්‍රීඩා පුහුණුකරුවන්ගේ අවම වැටුප රු.25000/- දක්වා වැඩි කිරිමට කටයුතු කිරිම.

## පාසල් සංවර්ධන සමිතිය

## සුභසාධක අනුකම්ටු වාර්තාව - 2023/2024

- අප්‍රේල් මස 10/11 වසර ගුරු මහත්ම මහත්මීන් වෙනුවෙන් විදුහල්පතිතුමිය විසින් පවත්වන ලද රැස්වීම සඳහා සංග්‍රහයක් සූදානම් කිරිම.
- පළමු වසර දියණියන්ගේ පළමු දින පිළිගැනීමේ උත්සවයේ සංවිධාන කටයුතු සඳහා උපකාර කිරීම.
- 2023 මැයි මස 29,30,31 සහ ජූනි මස 01 යන දින වල පැවැත්වූ 10/11 ශිෂ්‍යාවන්ගේ ඉගෙනීමේ කටයුතු කරන ගුරුභවතුන් හට සංග්‍රහයක් කිරීම.
- ජූනි මස 14 දින ගුරු මහත්ම මහත්මීන් වෙනුවෙන් විදුහල්පතිතුමිය විසින් පවත්වන ලද රැස්වීම සඳහා සංග්‍රහයක් සූදානම් කිරීම.
- විදේශිය අමුත්තන් සඳහා ජූලි මස 18 වන දින සංග්‍රහයක් සූදානම් කරන ලදි.
- 10/11 වසර සිසුන් සඳහා සම්මන්ත්‍රණය පැවැත්වූ විද්වතුන් දෙදෙනා සඳහා තිළිණපත් දෙකක් ලබාදීම.
- 8 වසර සිට 10 වසර දක්වා ලකුණු 40ට වඩා අඩු සිසුවියන්ට සිංහල, ගණිතය, ඉංගිසි විෂයන් සඳහා අමතර පන්ති මගින් උගන්වන ලද ගුරුවරුන්ට දින පහක් උදෑසන තේ සංග්‍රහයක් ලබාදෙන ලදි.
- ඔක්තොම්බර් මස ගණිත අංශයේ ශිෂ්‍යාවකට පාසල් නිල ඇඳුම් සහ වෙනත් පාසල් උපකරණ ලබා ගැනීමට උපකාර කරන ලදි.
- නොවැම්බර් මස නේවාසිකාගාර සිසුවියකට උපැස්යුවලක් ලබාදීම.
- දෙසැම්බර් මස 10/11 වසර සිසුන් සඳහා අමතර ඉගැන්වීම් කළ ගුරුභවතුන්ට උදෑසන තේ සංග්‍රහයක් සූදානම් කිරීම.

# සමස්ත ලංකා ක්‍රීඩා ජයග්‍රහණ - 2023

## Wushu

**Wushu Youth Tournament – All Island 2023**

| | | | |
|---|---|---|---|
| Under 14 | Taichi Event | 1st Place | Sahani Piyumini Kariyawasam |
| Under 14 | Taichi Event | 2nd palce | Vijayee Vidhanarchchi |
| Under 16 | Jianshu Event | 3rd Place | B.A.Thenuli Bamunusinghe |
| Under 18 | Taichi Event | 1st Place | Anuthmi gamage |
| Under 18 | Taichi Jian Event | 1st Place | Anuthmi gamage |
| Under 18 | Jianshu Event | 3rd Place | Thisakya Vithana |

**All Island School Games**

| | |
|---|---|
| Under 18 Nanqual | 2nd Place |
| Under 18 Thaichiquan | 1st Place |
| Under 20 Thaichiquan | 3rd Place |
| Under 20 Group | 3rd Place |

## Rowing

**Sri Lanka National Junior Rowing Championship**

| | | |
|---|---|---|
| Under 12 | Single Scull | 1st place |
| Under 12 | Double Scull | 2nd place |
| Under 14 | Quadruple Scull | 2nd place |
| Under 16 | Quadruple Scull | 2nd place & 3rd Place |
| Under 16 | Pair | 2nd Place |
| Under 18 | Quadruple Scull | 3rd place |
| Under 20 | Quadruple Scull | 2nd place |
| Under 20 | Double Scull | 2nd place |

## Athletics

**Athletic Junior National Championship -2023**

| | | |
|---|---|---|
| Under 16 | Hammer Throw | 1st place |
| Under 23 | 400m | 3rd Place |
| Under 23 | 200m | 2nd Place |

## Table Tennis

**All Island Team Championship -2023**

| | |
|---|---|
| Under 12 (A.Div) | 2nd Place |
| Under 14 (A.Div) | 2nd Place |
| Under 18 (B.Div) | 2nd Place |
| Under 19 (A.Div) | 3rd Place |

**Junior National Table Tennis Championship**

| | | | |
|---|---|---|---|
| Under 11 | Single | 2nd Place | Senaya Hulangamuwa |
| Under 17 | Single | 3rd Place | Nadithi Rehansa |
| Under 19 | Single | 3rd Place | Nadithi Rehansa |
| Under 19 | Doubles(Mixed) | 2rd Place | Nadithi Rehansa |

**All Island National School Games – 2023**

Under 20 –Runnerup

## Squash

**34th Junior National Squash Championship**

| | | |
|---|---|---|
| Under 19 | 3rd Place | Anagi Perera |
| Under 9 | 3rd Place | Dheerya Silva |

## Badminton

**All Island National School Games 2023**

| | |
|---|---|
| Under 20 | Runner-up |

## Handball

**All Island Handball Tournament – 2023**

| | |
|---|---|
| Under 17 | 2nd Runner-up |
| Under 20 | 2nd Runner-up |

**Sri Lanka Inter school Handball Tournament – 2023**

| | |
|---|---|
| Under 16 (A Team) | 3rd Place |
| Under 16 (B Team) | Runner-up |

## A.Swimming

**National & Junior Aquatic Championship – 2023**

| | | |
|---|---|---|
| Junior Nationals (Duet) | 3rd Place | Dhananji Senanyaka & Saheli Kulasekara |
| Senior Nationals (Duet) | 2nd Place | Manekha Gomez & Piyushi Kulasekara |
| Senior Nationals (Solo) | 3rd Place | Piyushi Kulasekara |
| Senior Nationals (Solo) | 2nd Place | Manekha Gomez |

**National Age Group Championship**

| | |
|---|---|
| Youth 13-15 (Duel) | 3rd Place |
| Junior 15-19 (Solo) | 2nd & 3rd Place |
| Junior 15-19 (Duel) | 2nd Place |

## Swimming

| | |
|---|---|
| Sri Lanka Schools | 1st Place |
| Western Province | 1st Place |
| Nationals | 1st Place |
| Age Group | 1st Place |
| Nationals & Junior Nationals | 2nd Place |
| Pentathalan | 4th Place |
| Sea Swim | 5th Place |
| Junior Nationals Short Course | 5th Place |

## Diving

**International Age Group Diving Championship – 2023**

| | | | |
|---|---|---|---|
| Overall Position | Runners -Up | | |
| 1m Springboard | Under 17 | 1st place | Imandi Mahawatte |
| 1m Springboard | Under 20 | 1st place | Sanyumi Sirimanna |
| 3m Springboard | Under 20 | 1st Place | Sanyumi Sirimanna |

**National Diving Championship**

| | | |
|---|---|---|
| Overall Position | 3rd Place | |
| Sub Junior Nationals Best Diver (girls) | | Vinudi Kankanamge |
| 1m Springboard | 1st Place | Vinudi Kankanamge |
| 3m Springboard | 1st Place | Vinudi Kankanamge |
| Platform | 2nd Place | Vinudi Kankanamge |

**48th Annual Sri Lanka Schools all Island Age Group Aquatic Championships 2023**

| | | | |
|---|---|---|---|
| Under 16 | Platform | 1st Place | Vinudi Kankanamge |
| Under 20 | Platform | 3rd Place | Vinudi Kankanamge |
| Under 16 | 3m Springboard | 2nd Place | Vinudi kankanamge |
| Under 20 | 3m Springboard | 4th Place | Sanyumi Sirimanna |
| Under 16 | 1m Springboard | 4th Place | Vinudi Kankanamge |
| Under 20 | 1m Springboard | 4th Place | Sanyumi Sirimanna |

**47th National Age Group Diving Championship 2023**

| | | |
|---|---|---|
| Platform | 2nd Place | Vinudi Kankanamge |
| 1m Springboard | 2nd Place | Vinudi Kankanamge |
| 3m Springboard | 3rd Place | Vinudi Kankanamge |

## Waterpolo

**RCUAC Challenge Shield 2023**

| | |
|---|---|
| Under 11 | 2nd Place |
| Under 13 | 1st Place |
| Under 18 | 1st Place |

**National Age group Championship 2023**

| | |
|---|---|
| Under 15 | 1st Place |
| Under 13 | 2nd Place |
| Under 17 | 2nd Place |

**National Waterpolo Championship 2023**

Open Category – 3rd Place

**Junior National Waterpolo Championship – 2023 – 1st Place**

## Gymnastics

**Aerobic Gymnastics (All Island School games) – 2023**

**Trio**

Under 18 2nd Place Nethuli Omethma, sanuli Sadevma, Vinuthi Chanithma

Under 20 1st Place Ruvindi Kavya, Amandi Idushani, Semini Anushika

**Individual**

| | | |
|---|---|---|
| Under 18 | 1st Place | Nethuli Omethma |
| Under 20 | 1st Place | Amandi idushani |
| Under 20 | Best player | Amandi idushani |
| Best Player of the Tournament | | Nethuli omethmaAmandi Idushani |

## **Chess**

**National Schools Team Chess Championship – 2023 ( Western Province selection)**

Under 20 champions

**National Youth Chess championship ( Colombo District Selections)**

| | | |
|---|---|---|
| Under 7 | 2nd runner-Up | Dinudi yesansa |
| Under 12 | Champion | Thinuli Disansa |

| | | |
|---|---|---|
| World Schools Selection Special Event | Under 17 | 2nd Place |
| Youth Blizt Chess Championship | Under 16 | 3rd Place |
| National Youth Rapid Chess Championship | Under 14 | 2nd Place |
| Sri Lanka National Youth Championship | Under 16 | Championship |
| Asian School Chess Tournament | Under 17 | Champion |
| SLSCA Individual Chess Championship | Under 13 | 2nd Place |
| National Youth Chess Championship | Under 17 | Champion |
| National Youth Chess Championship | Under 19 | 2nd Place |

**පාසල් සංවර්ධන සමිති චක්‍ර ලේඛයට අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත කමිටු සාමාජික සංඛ්‍යාව 20 ක් විය යුතු හෙයින් ඊට අනුකූලව තෝරා පත් කර ගත යුතු පාසල් සංවර්ධන සමිති සාමාජික සාමාජිකාවන්ගේ ලේඛනය**

| | | |
|---|---|---|
| 1. සභාපතිනිය | (විදුහල්පතිනිය) | 01 |
| 2. ලේකම් | (දෙමාපියෙක්) | 02 |
| 3. භාණ්ඩාගාරික | (ගුරුභවතෙක්) | 03 |
| 4. නියෝජ්‍ය විදුහල්පතිනිය | | 04 |
| 5. 1-5 අංශ නියෝජනය | (නියෝජ්‍ය විදුහල්පතිනිය) | 05 |
| 6. 6-7-8-9 අංශ නියෝජනය | (අංශ භාර හෝ ගුරුවරියක්) | 06 |
| 7. 10 – 11 අංශ නියෝජනය | (අංශ භාර හෝ ගුරුවරියක්) | 07 |
| 8. 12 – 13 අංශ නියෝජනය | (අංශ භාර හෝ ගුරුවරියක්) | 08 |
| 9. ආදි ශිෂ්‍යා සංගමයෙන් | (නියෝජිතයින් දෙදෙනෙක්) | 10 |
| 10. 1,2 හා 3 ශ්‍රේණි නියෝජිත | (දෙමාපියෙක්) | 11 |
| 11. 4,5 ශ්‍රේණි නියෝජිත | (දෙමාපියෙක්) | 12 |
| 12. 6,7 ශ්‍රේණි නියෝජිත | (දෙමාපියෙක්) | 13 |
| 13. 8,9 ශ්‍රේණි නියෝජිත | (දෙමාපියෙක්) | 14 |
| 14. 10,11 ශ්‍රේණි නියෝජිත | (දෙමාපියෙක්) | 15 |
| 15. 12,13 ශ්‍රේණි නියෝජිත (විද්‍යා) | (දෙමාපියෙක්) | 16 |
| 16. 12,13 ශ්‍රේණි නියෝජිත (කලා) | (දෙමාපියෙක්) | 17 |
| 17. ගුරු නියෝජිත (ක්‍රීඩා) | (ගුරුභවතෙක්) | 18 |
| 18. ගුරු නියෝජිත (සෞන්දර්ය) | (ගුරුභවතෙක්) | 19 |
| 19. කලාප අධ්‍යාපන කාර්යාල නියෝජිත | | 20 |

**ආරාධිත**

| | | |
|---|---|---|
| උප ලේකම් | ගුරුභවතෙක් | 01 |
| සුබ පතන්නන් | (විශේෂ) | 02 |
| ආදි ශිෂ්‍යා සංගමයෙන් | | 02 |
| පාසල් සංවර්ධන සමිති නියෝජිත | | 04 |
| විගණන කටයුතු | | 01 |

මෙම අනුපිළිවෙළ දෙමාපියන්ගෙන් ලත් යෝජනා අනුව සහ විදුහල්පතිනියගේ නිර්දේශය මත පිළියෙල කරන ලද්දකි.

# ලේකම්තුමිය ගේ වාර්තාව...

<u>හැඳින්වීම</u>

- ✓ පාසල් සංවර්ධන සමිතිය (පා. සං. ස.) යනු, පාසලේ අධ්‍යාපනය ලබන සියලුම දියණියන්ගේ අධ්‍යාපනික අපේක්ෂා සහ අභිමතාර්ථ සපුරාලන පරිදි පාසල තුළ සාමාජයීය, සංස්කෘතිකමය සහ ආර්ථිකමය වශයෙන් ඵලදායී වෙනසක් සිදු කිරීමට දායක වීමේ අපේක්ෂාවෙන් පිහිටුවා ඇති සමිතියකි.
- ✓ පහත සඳහන් අංක (i), (ii) සහ (v) හැර පා. සං. ස. යේ සෙසු සාමාජිකයන් සියලු දෙනා ම සාමාජික ගාස්තු ගෙවා මෙහි සාමාජිකත්වය ලබා ගනු ලබයි.
  - (i) පාසලේ විදුහල්පතිනිය ඇතුළු ගුරු මණ්ඩලය
  - (ii) පාසල් ශිෂ්‍ය පැමිණීමේ නාම ලේඛනයේ නම සඳහන් දරුවන්ගේ දෙමව්පියන්/නීත්‍යානුකූල භාරකරුවන්
  - (iii) පාසලේ ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකාවන්
  - (iv) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු/ඇය විසින් නම් කරනු ලබන කලාප/කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයේ නිලධාරියෙකු
- ✓ වාර්ෂිකව පවත්වනු ලබන මහා සභා රැස්වීමකදී පහත සංයුතියෙන් යුතුව පා. සං. ස. විධායක කමිටුව පත් කරගනු ලබයි.
  - (i) විදුහල්පතිනිය ඇතුළු නියෝජ්‍ය විදුහල්පතිවරුන් සහ සහකාර විදුහල්පතිවරුන්
  - (ii) ලේකම්තුමිය
  - (iii) භාණ්ඩාගාරිකතුමිය
  - (iv) උපලේකම්තුමිය
  - (v) ගුරු මණ්ඩල නියෝජිතයන් →
    - ප්‍රාථමික අංශය භාර
    - 6/7 අංශය භාර
    - 8/9 අංශය භාර
    - 10/11 අංශය භාර
    - උ. පෙ. විද්‍යා/ගණිත අංශය භාර
    - උ. පෙ. කලා අංශය භාර
    - උ. පෙ. වාණිජ අංශය භාර
    - සංගීත සහ කලා අංශය නියෝජනය
    - ක්‍රීඩා අංශ නියෝජනය
  - (vi) දෙමව්පිය නියෝජිතයන් 08
  - (vii) ආදිශිෂ්‍ය සංගමයේ නියෝජිතයන් දෙදෙනෙකු
  - (viii) කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජිතයකු
- ✓ පා. සං. ස. විධායක කමිටුව යටතේ අනුකමිටු 6 ක් තිබෙන අතර, ලේකම්තුමිය ප්‍රමුඛ අනුකමිටු කැඳවුම්කරුවන් සහ ඒවායේ සාමාජික සාමාජිකාවන් එක් වී පාසලේ පවතින විවිධ සංවර්ධන කටයුතු සඳහා මෙම අනුකමිටු හරහා විශාල සහයෝගයක් දෙනු ලබයි.
  - (i) භෞතික සම්පත් අනුකමිටුව
  - (ii) අධ්‍යාපන අනුකමිටුව
  - (iii) ක්‍රීඩා අනුකමිටුව
  - (iv) බෞද්ධ අනුකමිටුව
  - (v) පරිසර අනුකමිට
  - (vi) ආරක්ෂක සහ ප්‍රවාහන අනුකමිටුව
- ✓ පා. සං. ස. විධායක කමිටුවේ ප්‍රධාන වගකීම →
  - (i) පාසල වෙනුවෙන් හඳුනාගනු ලැබූ අවශ්‍යතා මත පදනම්ව ක්‍රමෝපායික සැලසුම්, සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති පිළිබඳ සුදුසු තීරණ ගැනීම සහ යෝජනා සහ සැලසුම් සම්පාදනය මෙන්ම එම අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි අදාළ සැලසුම් ක්‍රියාත්මක කිරීම.
  - (ii) පාසලේ දෛනික සහ විශේෂිත වියදම් සඳහා අවශ්‍ය මූල්‍යාමය ප්‍රතිපාදන ලබා දීම මෙන්ම එම මුදල් සම්පාදනය සඳහා අවශ්‍ය ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම.
  - (iii) පාසල හා සම්බන්ධ ඇතැම් තීරණ ගැනීම සඳහා සහාය වීම.

## ප්‍රගති සමාලෝචනය සහ ස්තුතිය

- ✓ ප්‍රථමයෙන්ම මා කෙරෙහි විශ්වාසය තබා පා. සං. ස. යේ ගරු ලේකම්තුමිය වශයෙන් 2023/2024 වර්ෂය සඳහා ද මා නිල වශයෙන් තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් මා ඔබ සියලු දෙනාටම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමි.
- ✓ 2022/2023 වර්ෂයට සාපේක්ෂව, 2023/2024 වර්ෂය තුළ පාසලේ බොහොමයක් විෂය බාහිර කටයුතු සිදුකර ගැනීමට හැකි වීම ඉතාමත්ම සතුටට කරුණකි. එම කටයුතු බොහොමයක් සඳහා පා. සං. ස. විධායක කමිටුව හරහා විශාල සහයෝගයක් ලබා දීමට හැකි වීම ද සතුටට කරුණකි.
- ✓ පළමු ශ්‍රේණිය දියණියන් පිළිගැනීමේ "සිහිනි පියවිලි" උත්සවය, වාර්ෂික පිරිත් පිංකම සහ දානය, වාර්ෂික ක්‍රීඩා උත්සවය, වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය සාර්ථකව කරගැනීමට එම උත්සව සඳහා අප විධායක කමිටුව ඇතුළු අනුකමිටු සාමාජිකත්වයෙන් ලබා දුන් සහාය සුවිශේෂය.
- ✓ ලෝක ගුරු දිනයට සමාන්තරව, පාසලේ ගුරු මෑණි වරුන් සහ පියවරුන් හට උපහාර පිදීම උදෙසා "ගුරු පා පියුම් වන්දනා - 2023" ගුරු උපහාර උලෙළ ඇති සාර්ථක ලෙස සංවිධානය කොට ගුරු උපහාර පිදීමට පා. සං. ස. විධායක කමිටුවට හැකි වීම විශාල ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ යුතුය.
- ✓ වසර පහක දීර්ඝ නිහැඬියාවකට පසු, දහසකුත් එකක් බාධක මධ්‍යයේ, පාසලේ ඉහළ ශ්‍රේණිවල දියණියන්ගේ දක්ෂතා කරළියට ගෙන ඒමට මෙන්ම පාසලට අවශ්‍ය අරමුදල් සම්පාදනය කරගැනීම සඳහා අති සාර්ථක ලෙස "මියැසි විසාකා" ප්‍රසංගය සංවිධානය කරගැනීමට හැකි වීම අප කමිටුවේ සුවිශේෂී ජයග්‍රහණයකි.
- ✓ භෞතික සම්පත් අනුකමිටුව යටතේ පාසල තුළ විශාල අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු ප්‍රමාණයක් සිදු කිරීමට පා. සං. ස. විධායක කමිටුවට සිදු විය. මේ සියලුම කටයුතු සඳහා පා. සං. ස. සාමාජිකයන් වන අප පාසලේම දරුවන්ගේ දෙමාපියන් විසින් මූල්‍යමය වශයෙන් සහ ද්‍රව්‍යමය වශයෙන් ලබා දුන් සහාය අගය කළ යුතුමය. 6 ශ්‍රේණිය ගොඩනැගිල්ලේ අලුත් Sun Shade කොටස සවි කිරීම, පාසලේ පිහිනුම් තටාකයේ වහළය සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කිරිම, පරිපාලන සහ උසස් පෙළ විද්‍යා අංශ ගොඩනැගිල්ලේ වහළයේ අලුත්වැඩියාව මේ අතුරින් ප්‍රධාන කටයුතු කිහිපයකි. මෙවැනි බොහොමයක් නඩත්තු කටයුතු සාර්ථකව සිදු කිරීමට පා. සං. ස. විධායක කමිටුව විසින් ලබා දුන් ශිල්පීය දැනුම ඉතාමත්ම ප්‍රයෝජනවත් බව නොකියා බැරිය.
- ✓ අධ්‍යාපන අනුකමිටුව යටතේ 2022 වර්ෂයේ අ. පො. ස. (උ. පෙ.) විභාගය විශිෂ්ට ලෙස සමත් වුණු දියණියන් සහ ඔවුන් දිරිමත් කරමින් මග පෙන්වූ ගුරු මහත්ම මහත්මීන් කළ මහඟු සේවය ඇගයීම සඳහා ඉතාමත්ම සාර්ථක සිසු - ගුරු උපහාර උලෙළ ක් සංවිධානය කරන ලදී. එමෙන්ම 2023 වර්ෂයේ අ. පො. ස. (සා. පෙ.) විභාගය සමත් වුණු දියණියන් දිරිමත් කළ ගුරු මහත්ම මහත්මීන් ඇගයීම සඳහා ද ගුරු උපහාර උලෙළක් සංවිධානය කිරීමට මෙම අනුකමිටුවට හැකි විය. ඊට අමතරව මෙලෙස පාසලේ අධ්‍යාපන සංවර්ධනය උදෙසා පා. සං. ස. විධායක කමිටුව ලබා දුන් සහයෝගය අතිමහත්ය.
- ✓ බෞද්ධ අනුකමිටුව පාසලේ බෞද්ධ සංගමය විසින් සිදු කරනු ලබන සෑම පුණ්‍යමය කටයුත්තකදීම සිය උපරිම සහාය ලබා දෙන ලදී. පාසල් උපන්දිනය වෙනුවෙන් පවත්වන ලද බෝධි පූජාව සහ දහවල් දානමය පිංකම මෙන්ම පාසලේ ආදි කර්තෘ තුමිය සැමරීම සඳහා වාර්ෂිකව පවත්වනු ලබන සර්වරාත්‍රික පිරිත් දේශනය සහ පසුදින දහවල් දානමය කටයුතුද සාර්ථකව කරගැනීමට අප අනුකමිටුව ඇතුළු විධායක කමිටුව විශාල සහයෝගයක් ලබා දෙන ලදී.
- ✓ ක්‍රීඩා අනුකමිටුව මගින් පාසලේ ක්‍රීඩා කටයුතු සංවර්ධනය සඳහා විශාල මෙහෙයක් ඉටු කරන ලදී. පාසල් පිට්ටනියේ, ක්‍රීඩාගාරයේ සහ පිහිනුම් තටාකයේ පවතින අඩුපාඩු රැසක් සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය සංවර්ධන කටයුතු රැසක් සාර්ථකව සිදු කිරීමට මෙම අනුකමිටුව යටතේ හැකි විය.
- ✓ පරිසර අනුකමිටුව පාසල් පරිශ්‍රය තුළ තිබුණු අනාරක්ෂිත ගස් කපා ඉවත් කිරීම, ඩෙංගු මදුරු මර්දන ව්‍යාපාරය මෙන්ම පරිසර සංගමය සමග එකට එක් වී පාසලේ පරිසර පද්ධතිය අලංකාර කිරීම වැනි ඉතා වැදගත් කාර්යයන් රැසක් සිදු කරන ලදී.

- ✓ ආරක්ෂක සහ ප්‍රවාහන අනුකමිටුව විසින් පාසලේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශාල මෙහෙයක් ඉටු කරන ලද අතර පාසල සතු සියලු රථ වාහන සම්බන්ධ කටයුතු පිළිබඳව සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමද මෙම අනුකමිටුව විසින් සිදු කරන ලදී.
- ✓ පාසල තුළ නිරන්තරයෙන් පැන නගින විවිධ අවශ්‍යතාවයන් සාක්ෂාත් කරගැනීම සඳහා සක්‍රියව උපකාර කරමින්, තම පෞද්ගලික ධනය පවා වියදම් කරමින් පාසල් සංවර්ධන සමිතියේ විධායක කමිටුව විසින් සිදු කරනු ලබන්නේ මහඟු සේවයක් බව ඉඳුරාම ප්‍රකාශ කිරීම මාගේ යුතුකමක් ලෙස සලකමි.
- ✓ සභාපතිතුමිය වන පාසලේ විදුහල්පතිතුමියගේ නිසි මග පෙන්වීම සහ නොමඳ සහයෝගය යටතේ ඉහත සඳහන් කල, නොකළ සියලුම ව්‍යාපෘති අති සාර්ථකව ඉටු කරගැනීමට පා. සං. ස. විධායක කමිටුවට හැකි වීම අප ලද විශාල ජයග්‍රහණයක් වන අතර ඒ වෙනුවෙන් අප සියලු දෙනාගේම ගෞරවනීය ස්තුතිය විදුහල්පතිතුමිය වෙත පුද කර සිටිමි.
- ✓ එමෙන්ම මේ සියලු කටයුතු සඳහා නොමඳ සහායක් සහ මග පෙන්වීමක් ලබා දුන් සියලුම නියෝජ්‍ය විදුහල්පතිතුමියන්, සහාය විදුහල්පතිවරුන්, අංශ ප්‍රධාන සහ ශ්‍රේණි ප්‍රධාන ගුරු මහත්මීන් පමණක් නොව පාසලේ ආචාර්ය මණ්ඩලයේ සියලුම ගුරු මහත්ම මහත්මීන් හට පා. සං. ස. විධායක කමිටුවේ හද පිරි ස්තුතිය මේ අවස්ථාවේදී පුද කර සිටිමි.
- ✓ මේ සියලු කටයුතු වලදී අප හා අත්වැල් බැඳ ගනිමින් අප හට මහඟු සහයෝගයක් ලබා දුන් පාසලේ ආදී ශිෂ්‍යා සංගමයට අප සියලු දෙනාගේම ගෞරවනිය ස්තුතිය පුද කර සිටිමි.
- ✓ එමෙන්ම පාසලේ සෑම සංවර්ධන කටයුත්තකදීම මුදලින් පමණක් නොව විශේෂඥ දැනුමෙන් සහ ශ්‍රමයෙන් පවා විශාල සහයක් ලබා දෙමින් අප හා නිරතුරුව රැඳෙමින් පා. සං. ස. විධායක කමිටුවට ඇති විශාල සහයක් ලබා දුන් අපගේ සියලුම සාමාජික දෙමව්පියන් වෙත මේ අවස්ථාවේදී අප විධායක කමිටුවේ හද පිරි ස්තුතිය පුද කර සිටිමි.
- ✓ පාසලේ නිරන්තර දියුණුව පතන පාසලේ සුබ පතන්නන්ගෙන් අප විධායක කමිටුවට ලැබෙන සහාය වෙනුවෙන් ද ගෞරවනීය ස්තුතිය පුද කර සිටිමි.
- ✓ පාසලේ අනධ්‍යාන කාර්ය මණ්ඩලය සහ පාසලේ ආරක්ෂක අංශය ඇතුළු පාසලේ සියලුම සේවක මහත්ම මහත්මීන් විසින් අප විධායක කමිටුව වෙත නිරන්තරයෙන් ලබා දෙන මහඟු සහයෝගය වෙනුවෙන් අප සියලු දෙනාගේම ස්තුතිය පුද කර සිටිමි.
- ✓ වර්තමානයේ අප රට තුළ පවතින ආර්ථික සහ සමාජයීය ගැටළු මධ්‍යයේ වුවද අප දරුවන්ගේ පාසල සංවර්ධනය කිරීම සඳහා පා. සං. ස. විධායක කමිටුව විසින් ලබා දුන් මහඟු උපකාරය මේ ආකාරයෙන්ම සහ මීටත් වඩා සාර්ථක ලෙස මින් ඉදිරියටත් ලබා දීමට අපි සියලුම දෙනා බලාපොරොත්තු වන අතර, ඒ සඳහා ඔබ සියලු දෙනාගේම සහාය ඒ ආකාරයෙන්ම ලබා දෙනු ඇතැයි අපේක්ෂා කර සිටිමු.

ස්තුතියි...

වෛද්‍ය රසංගනී ප්‍රේමතිලක මිය
ගරු ලේකම් - පා. සං. ස. විධායක කමිටුව
විශාඛා විද්‍යාලය - කොළඹ 05
(2024/03/25)